**සමථ මණ්ඩල කොමිෂන් සභාව**

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 5 (1) වැනි වගන්තිය මගින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ අනුව, සමථ මණ්ඩල කොමිෂන් සභාව පහත නම් සඳහන් සමථකාවරුන් මෙහි පහත දක්වා අති සමථ මූල මණ්ඩල ප්‍රදේශවල සමථකාරවරුන් වශයෙන් ඒ ඒ සමථ මූල මණ්ඩල ඉදිරියේ දක්වා ඇති දින සිට (පසුව කරන ලද සංශෝධන එසේම වලංගු වේ.) ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇති බවපොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

වාසනා පී. ගුණරත්න,
ලේකම් (*වැඩබලන*),
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2013 ජූලි මස 26 වැනි දින,
කොළඹ 12,
උපරිමාධිකරණ සංකීර්ණය,
අධිකරණ අමාත්‍යාංශය,
03 වන මහල,
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

2012 සැප්තැම්බර් මස 26 වැනි බදාදා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඇති සමථ මණ්ඩල පත්වීම් ලේඛනයේ අම්පාර දිස්ත්‍රික්කයේ 232-සම්මාන්තුරෙයි සමථ මූල මණ්ඩලයේ අනු අංක 03 යටතේ සටහන් වී ඇති තොරතුරු පහත සඳහන් පරිදි අනු අංක 1, යටතේ ද,

2013 පෙබරවාරි මස 06 වැනි බදාදා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඇති සමථ මණ්ඩල පත්වීම් ලේඛනයේ සංශෝධන 02 යටතේ ඇති අනු අංක 2.ට ඇතුළත් තොරතුරු පහත සඳහන් පරිදි අනු අංක 2. යටතේ ද සංශෝධනය විය යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| 1. | 232/08 | යූ. එල්. මහරූෆ් මහතා | සින්නපිල්ලෙයි පාර, සම්මාන්තුරෙයි | උප සභාපති |
| 2. | 232/07 | එම්. වයි. ඒ. ජලීල් මහතා | අංක 16/සී, හිජ්රා 10 වැනි පාර, සම්මාන්තුරෙයි | සාමාජික |

08 - 608